ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

බුද්ධ ධර්මය I
பௌத்தம் I
Buddhism I

41 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ** පිළිතුර (1), (2), (3), (4), (5) යන පිළිතුරු අතුරෙන් තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

1. කාරණය කාරණය වශයෙන් ද, අකාරණය අකාරණය වශයෙන් ද තතු ලෙස දන්නා බුද්ධ ඤාණය හැඳින්වෙන්නේ,
   (1) අසාධාරණ ඤාණය ලෙස ය.
   (2) දිබ්බචක්ඛු ඤාණය ලෙස ය.
   (3) ඨාන අට්ඨාන ඤාණය ලෙස ය.
   (4) සබ්බත්ථ ගාමිණී පටිපදා ඤාණය ලෙස ය.
   (5) ආසයානුසය ඤාණය ලෙස ය.

2. බුදුරජාණන් වහන්සේ තුළ මෙන් ම විමුක්තිලාභී ශ්‍රාවකයන් වෙත ද ඇති උතුම් ඤාණාධිගමයන් අතර ත්‍රිවිද්‍යාව සුවිශේෂ වෙයි. ඉන් එකක් නම්,
   (1) අනාවරණ ඤාණයයි.
   (2) මහාකරුණා සමාපත්ති ඤාණයයි.
   (3) ඉද්ධිවිධ ඤාණයයි.
   (4) සබ්බත්ථ ගාමිණී පටිපදා ඤාණයයි.
   (5) චුතූපපාත ඤාණයයි.

3. දෙවියෙක් බ්‍රහ්මයෙක් නොව මනුෂ්‍යයෙක් වූ බුදුරජාණන් වහන්සේ විවිධ රෝගාබාධයන්ට විටින් විට ගොදුරු වූහ. එබඳු එක් අවස්ථාවක් වාර්තා වන්නේ,
   (1) මහාපරිනිර්වාණ සූත්‍රයේ ය.
   (2) සච්චවිභංග සූත්‍රයේ ය.
   (3) පාරාජිකපාළියේ ය.
   (4) අරියපරියේසන සූත්‍රයේ ය.
   (5) බුද්ධවංසපාළියේ ය.

4. අන්‍යන්ගේ අදහස්වලට සාවධානව සවන්දීම හා සාධාරණ අදහස් පිළිගැනීම බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණයකි. එම බුදුගුණය ප්‍රකට වන්නේ,
   (1) සච්චක හමුවූ අවස්ථාවෙනි.
   (2) අභයරාජ කුමරු සමග කළ සාකච්ඡාවෙනි.
   (3) සුදොවුන් මහරජු බුදුරදුන් හමුවූ තැන ය.
   (4) සෝණදණ්ඩ බමුණා බුදුරදුන් බැහැදුටු අවස්ථාවෙනි.
   (5) උපාලි ගෘහපති හා බුදුරදුන් හමුවූ තැන ය.

5. වනගතව රුක්මුල්හි බවුන් වැඩූ භික්ෂු පිරිසක් විවිධ විකාර රූප දක්වමින් බියගන්වා පලවා හැරීමට එම රුක් මුදුන්වල විසූ දෙවිවරුන් උත්සාහ කිරීමේ සිද්ධියක් මුල්කොටගෙන බුදුරදුන් කළ දේශනාව හැඳින්විය හැක්කේ,
   (1) පුච්ඡාවසික දේශනාවක් ලෙස ය.
   (2) අට්ඨුප්පත්තික දේශනාවක් ලෙස ය.
   (3) සාමුක්කංසික දේශනාවක් ලෙස ය.
   (4) පරියාය දේශනාවක් ලෙස ය.
   (5) පටිපුච්ඡාව්‍යාකරණ දේශනාවක් ලෙස ය.

6. අරුත් දක්වන, මනාකොට ප්‍රකාශ කළ, පැසවන, තුලකට සමාන වූ දේශනා ලෙස හැඳින්වෙන්නේ,
   (1) අභිධර්ම දේශනාවන් ය.
   (2) අට්ඨකථාවන් ය.
   (3) සූත්‍ර දේශනාවන් ය.
   (4) ශ්‍රාවක භාෂිතයන් ය.
   (5) විනය පැනවීම් ය.

7. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකාය ග්‍රන්ථ පසළොසකින් යුක්තවන අතර ඉන් එකක් නම්,
   (1) ධම්මසංගණිප්පකරණයයි.
   (2) චුල්ලවග්ගපාළියයි.
   (3) පේටකෝපදේසයයි.
   (4) උදානපාළියයි.
   (5) විසුද්ධිමග්ගයයි.

[දෙවැනි පිටුව බලන්න.

8. අභිධර්මය එනමින් හැඳින්වෙන්නේ පහත දැක්වෙන කරුණු අතුරෙන් එක් කරුණක් නිසා ය. එම කරුණ වන්නේ,
(1) සසර දුකට අභියෝග කිරීම ය.
(2) විශේෂ අතිරේක දේශනාවක් වීම ය.
(3) පළමුව දෙවියන්ට දේශනා කිරීම ය.
(4) විවිධ නය ඇති බව ය.
(5) ලෝක සම්මුතිය හා ගැළපීම ය.

9. ධර්මරත්නයේ සවැදෑරුම් ගුණ අතර ස්වාක්ඛාත යන්නෙන් ප්‍රකට වන්නේ බුද්ධ ධර්මය,
(1) දේව අනාවරණයක් නොවන බවයි.
(2) සිතා විමසා දත යුතු බවයි.
(3) සරණ යාමෙන් බොහෝ පින් රැස්වන බවයි.
(4) පිළිපැදීමෙන් මෙලොවදීම නිවන් දැකිය හැකි බවයි.
(5) මැනවින් ප්‍රකාශකොට ඇති බවයි.

10. "මෙය ම සත්‍ය ය. අන් සියල්ල අසත්‍ය ය." යනුවෙන් ධර්මය අන්තවාදී දෘෂ්ටියක් ලෙස නොගත යුතු බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ,
(1) සද්ධම්ම සම්මෝස සූත්‍රයෙනි.
(2) වීමංසක සූත්‍රයෙනි.
(3) කාලාම සූත්‍රයෙනි.
(4) දම්සක් පැවැතුම් සූත්‍රයෙනි.
(5) අලගද්දූපම සූත්‍රයෙනි.

11. ප්‍රාග් බෞද්ධ ශ්‍රමණ පැවිද්දේ පොදු ලක්ෂණ පිළිබඳව එක් ශිෂ්‍යයෙකු ලියා තිබූ ප්‍රකාශන පහක් පහත දැක්වේ. ඒ අතුරෙන් **වැරදි** ප්‍රකාශනය වන්නේ,
(1) "බ්‍රහ්මචාරී වීම" යන්නයි.
(2) "වර්ණාශ්‍රම ධර්ම නොපිළිගැනීම" යන්නයි.
(3) "සියලුදෙනා ම උච්ඡේදවාදී වීම" යන්නයි.
(4) "සංචාරක ජීවිත ගත කිරීම" යන්නයි.
(5) "විවිධ ගුරුකුල නියෝජනය කිරීම" යන්නයි.

12. මහාවග්ගපාළිය අනුව උපසම්පදාව ලබාගැනීමට හිමිකම් නොලබන භික්ෂූන් අතුරෙන් එක් අයකු වන්නේ,
(1) දාසකම් කරමින් සිට පැවිදි වූ තැනැත්තා ය.
(2) ගුරුවරයාට අකීකරු ශිෂ්‍යයා ය.
(3) ශාසනික චාරිත්‍ර නොසලකා හරින්නා ය.
(4) ප්‍රමාණවත් ධර්ම ඥානයක් නැති තැනැත්තා ය.
(5) අසූවිය ඉක්මවා සිටින්නා ය.

13. බුදුරදුන් විසින් භික්ෂූන් සඳහා පාමොක් උදෙසා විනය නීති පැනවීමට මුල් වූ දසවිධ අරමුණු අතුරෙන් එකක් නම්,
(1) සංඝයාගේ සමගියයි.
(2) සද්ධර්මයේ චිර පැවැත්මයි.
(3) භික්ෂු පාලනය පහසු වීමයි.
(4) අකුසල ධර්ම දුරු කිරීමයි.
(5) ගැටුම් වැළැක්වීමයි.

14. නවක උපසපන් භික්ෂුවකට සමාදන් කරවන නිස්සය ධර්ම සතරින් එකක් නම්,
(1) "ධම්මදායාදා හොථ භික්ඛවෙ මා ආමිස දායාදා" යන්නයි.
(2) "සමග්ගා හොථ මා විවදථ" යන්නයි.
(3) "පිණ්ඩියාලොපභොජනං නිස්සාය පබ්බජ්ජා" යන්නයි.
(4) "අත්තදීපා භික්ඛවෙ විහරථ" යන්නයි.
(5) "මා භික්ඛවෙ එකෙන ද්වෙ අගමිත්ථ" යන්නයි.

15. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නය "පරලොව අදහාගෙන පිරිනමන්නා වූ දානයට සුදුසු වන්නේ ය." යන අදහසින්,
(1) පාහුනෙය්‍ය ගුණයෙන් යුක්ත ය.
(2) අප්පිච්ඡතා ගුණයෙන් සමන්විත ය.
(3) සාමීචිපටිපන්න ය.
(4) ප්‍රදක්ෂිණා කිරීමට සුදුසු ය.
(5) දක්ඛිණෙය්‍ය නම් වේ.

16. වෛදික බ්‍රාහ්මණ ආශ්‍රම ධර්ම අනුව බ්‍රහ්මචාරීව ජීවත්වීම,
(1) යාවජීව වශයෙන් කළ යුතු ය.
(2) බ්‍රහ්මයා අනුගමනය කරමින් සිදු කළ යුතු ය.
(3) ළමා අවධියේදී සිදු කළ යුතු ය.
(4) කවර වර්ණයක අයකු වුව ද සිදු කළ යුතු ය.
(5) ජීවිතයේ අවසාන භාගයේදී සිදු කළ යුතු ය.

17. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව බුද්ධකාලීන ප්‍රසිද්ධ ශාස්තෲවරුන් සදෙනා අතරින් එක් අයෙකු වූ අජිත කේසකම්බල,
(1) කර්මය ප්‍රතික්ෂේප කළේ ය.
(2) විපාකය නොපිළිගත්තේ ය.
(3) කර්මය ද විපාකය ද බැහැර කළේ ය.
(4) කර්ම විපාක පිළිබඳ නිශ්චිත අදහසක් නොදැරුවේ ය.
(5) කර්මය පිළිගෙන විපාකය බැහැර කළේ ය.

18. "සියලු සත්ත්වයන් හේතුවක් ප්‍රත්‍යයක් නැතිව ම ශුද්ධියට මෙන් ම අශුද්ධියට ද පත් වන්නේ ය." යන මක්ඛලීගෝසාලගේ ඉගැන්වීම හැඳින්විය හැක්කේ,
(1) ශාස්වත වාදය ලෙස ය.
(2) සයංකත වාදය ලෙස ය.
(3) පුබ්බේකතහේතු වාදය ලෙස ය.
(4) අධිච්චසමුප්පන්න වාදය ලෙස ය.
(5) ඊශ්වර නිර්මාණ වාදය ලෙස ය.

19. ජෛන නිගණ්ඨයන් විසින් ද අනුගමනය කළ අසීමිත ලෙස කයට දුක් දීමේ පිළිවෙත බුදුසමය බැහැර කරන්නේ,
(1) කුසල ධර්මයන්ගේ වැඩි දියුණුවක් නොවන බැවිනි.
(2) උච්ඡේද වාදයට ඇතුළත්වන බැවිනි.
(3) කම්සැප විඳීමට බාධා කරන බැවිනි.
(4) බමුණු පිළිවෙතක් වූ බැවිනි.
(5) ගිහි ජනයාට අනුගමනය කළ නොහැකි බැවිනි.

20. අග්ගඤ්ඤ සූත්‍රය අනුව සමාජ පරිණාමය තුළ මිනිසා විසින් කරන ලද ප්‍රථම අකුසල කර්මය නම්,
(1) කේලාම් කියා අනුන් බිඳවීම ය.
(2) නුදුන් දේ ගැනීම ය.
(3) පරදාර සේවනය කිරීම ය.
(4) බොරුවෙන් අනුන් රැවටීම ය.
(5) පරපණ නැසීම ය.

21. බුදුරජාණන් වහන්සේ විසින් සිය ශ්‍රාවක ශ්‍රාවිකාවන් ධර්ම ප්‍රචාරයෙහිලා දිරිමත් කරනු පිණිස ගත් ක්‍රියාමාර්ග අතුරෙන් එකක් නම්,
(1) ධර්ම දේශනා විෂයෙහි පැවැති හැකියාවන් අගය කිරීම ය.
(2) ධර්මය වනපොත් කළ යුතු යැයි අවධාරණය කිරීම ය.
(3) දහම් පතපොත පරිශීලනයට ශ්‍රාවකයන් යොමු කිරීම ය.
(4) ඒ ඒ දිසාවල, ජනපදවල ධර්මායතන පිහිටුවීම ය.
(5) ධර්ම දේශක භික්ෂූන්ට පරිෂ්කාර පූජා කිරීමට ගිහියන් උනන්දු කර වීම ය.

22. සිවුවණක් පිරිසට ම ඇතුළත් විශේෂඥ ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට අගතනතුරු ලබා දුන් බුදුරජාණන් වහන්සේ විසින් ධර්ම කථික භික්ෂූන් අතර අගතනතුර ප්‍රදානය කරන ලද්දේ,
(1) සැරියුත් තෙරුන් වහන්සේට ය.
(2) පුණ්ණමන්තානි පුත්ත තෙරුන් වහන්සේට ය.
(3) අනුරුද්ධ තෙරුන් වහන්සේට ය.
(4) මහාකච්චාන තෙරුන් වහන්සේට ය.
(5) ආනන්ද තෙරුන් වහන්සේට ය.

23. බුදුරදුන් ධරමාන අවධිය තුළ ශාසනයේ යහ පැවැත්ම උදෙසා නොයෙක් අයුරින් අනුග්‍රහ කළ ගිහි උපාසකවරුන් අතුරෙන් එක් අයකු නම්,
(1) සන්ධාන ගෘහපති ය.
(2) බ්‍රහ්මදත්ත මානවකයා ය.
(3) පිලෝතික පිරිවැජි ය.
(4) අභයරාජ කුමරු ය.
(5) රජගහනුවර සිටුකුමා ය.

24. ප්‍රථම ධර්ම සංගායනා අවස්ථාවේදී ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හිමියන්ට එල්ල වූ චෝදනාවක් වූයේ,
(1) ඡන්න හිමිට බ්‍රහ්මදණ්ඩනය දීමට බුදුරදුන්ට යෝජනා නොකිරීම ය.
(2) බුදුරදුන්ගේ ආදාහන අවස්ථාවේදී මහා කාශ්‍යප තෙරුන්ට අවනත නොවීම ය.
(3) ඛුද්දානුඛුද්දක ශික්ෂා කවරේදැයි බුදුරදුන්ගෙන් නොවිමසීම ය.
(4) බුදුරදුන්ගෙන් අසා දැනගත් ධර්ම කරුණු භික්ෂූන්ට ප්‍රකාශ නොකිරීම ය.
(5) බුදුරදුන්ගේ පිරිනිවීම අසා ඔළාරික ලෙස හඬා වැළපීම ය.

25. දෙවැනි ධර්ම සංගායනාව බෞද්ධ ඉතිහාසය තුළ ශාසනික වශයෙන් ප්‍රතිඵල රාශියක් ඇති කිරීමට මුල් වූ බව බෞද්ධ මූලාශ්‍රය සනාථ කරයි. ඉන් එකක් ලෙස සැලකිය **නොහැක්කේ**,
(1) දසවස්තුව ධර්ම විනය විරෝධී බව ප්‍රකාශයට පත් කිරීම ය.
(2) රහතුන්ගේ තත්ත්වය පහත හෙළීමේ ප්‍රවණතා ඇති වීම ය.
(3) බුද්ධ වචනය සකු බසට පෙරළීම ය.
(4) අටලොස් නිකායක් ඇති වීමට මඟ පෑදීම ය.
(5) මහායාන බුදුදහම ඇති වීමේ මූලික පසුබිම සකස් වීම ය.

26. සම්මුති වශයෙන් සත්ත්වයා යැයි හඳුන්වනු ලබන ස්කන්ධ පංචකයෙහි සචේතනික වූ කුසලාකුසල කර්මයන් දැක්වෙන ස්කන්ධය,

(1) විඥාන ස්කන්ධයයි.
(2) සංඥා ස්කන්ධයයි.
(3) රූප ස්කන්ධයයි.
(4) වේදනා ස්කන්ධයයි.
(5) සංස්කාර ස්කන්ධයයි.

27. බුදුදහමේ දැක්වෙන ෂඩ් ධාතු විභාගයට ඇතුළත් වන ධර්මයක් නම්,

(1) මනෝ ධාතුව ය.
(2) ආකාශ ධාතුව ය.
(3) වස්තු ධාතුව ය.
(4) ඵස්ස ධාතුව ය.
(5) රස ධාතුව ය.

28. ත්‍රිලක්ෂණ ධර්මය පිළිබඳව සිසුන් පිරිසක් අතර වූ සාකච්ඡාවකදී පළ වූ අදහස් කිහිපයක් පහතින් දැක්වේ. ඒ අතුරෙන් ධර්මානුකූල **නොවන** අදහස වන්නේ,

(1) "ස්කන්ධාදී සියලු ධර්මයෝ ත්‍රිලක්ෂණයෙන් යුක්ත වෙති" යන්නයි.
(2) "තිලකුණු වැඩීම විපස්සනා නම් වේ" යන්නයි.
(3) "අනත්ත යනු ස්කන්ධ ධර්ම ආත්ම වශයෙන් සැලකිය නොහැක" යන්නයි.
(4) "අනිච්ච යනු ඉච්ඡාභංගත්වයයි" යන්නයි.
(5) "දුක්ඛ යනු ජාති, ජරා, මරණාදිය වේ" යන්නයි.

29. තුරුලතා සංරක්ෂණයට මගපෙන්වන ප්‍රකට බුද්ධ දේශනාවක් වූ වනරෝප සූත්‍රය අනුව අප කළ යුත්තේ,

(1) නිල් තණබිම් මත කැලිකසළ නොදැමීම ය.
(2) ආරණ්‍ය සේනාසන ආශ්‍රිත තුරුලතා ආරක්ෂා කිරීම ය.
(3) තුරුලතාවන්ට හානි කිරීමෙන් වැළකී සිටීම ය.
(4) ඇසතු වෘක්ෂයට ගරු බුහුමන් දැක්වීම ය.
(5) වනාන්තර හා උයන්වතු වගා කිරීම ය.

30. සිඟාලෝවාද සූත්‍රාගත සදිසා නමස්කාරය පිළිබඳ ලිපියක විස්තර කර තිබූ පරිදි බිරිඳ විසින් සැමියාට කළ යුතු ප්‍රත්‍යුපකාර කිහිපයක් පහත දැක්වේ. ඒ අතුරෙන් **වැරදි** ප්‍රකාශය වන්නේ,

(1) "සැමියාට ගරුබුහුමන් කිරීම" යන්නයි.
(2) "සැමියාගේ පිරිවරට සංග්‍රහ කිරීම" යන්නයි.
(3) "නිවසේ කටයුතු මැනවින් සිදු කිරීම" යන්නයි.
(4) "සැමියා සතු සම්පත් විනාශ නොකිරීම" යන්නයි.
(5) "දක්ෂව අනලස්ව ක්‍රියා කිරීම" යන්නයි.

31. දම්සක් පැවතුම් සූත්‍රයෙහි දුක්ඛ සමුදය හෙවත් දුක හටගැනීමේ හේතුව ලෙස පෙන්වා දී ඇත්තේ,

(1) අවිද්‍යාවයි. (2) තණ්හාවයි. (3) මෝහයයි. (4) ද්වේශයයි. (5) ඉපදීමයි.

32. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුව ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන උපදවා ගැනීම ඇතුළත් වන්නේ,

(1) සම්මා සතියට ය.
(2) සම්මා දිට්ඨියට ය.
(3) සම්මා වායාමයට ය.
(4) සම්මා සමාධියට ය.
(5) සම්මා සංකප්පයට ය.

33. බුද්ධකාලීන මහණ බමුණන් අතර ප්‍රචලිතව පැවැති අන්තවාදී සාමයික මතයක් වූ ශාස්වත දෘෂ්ටිය සමග ගැළපෙන ප්‍රකාශය කුමක් ද?

(1) එය අත්තකිලමථානු යෝගයට ප්‍රජාව යොමු කරයි.
(2) එය පරංකත වාදයට වැටෙයි.
(3) භෞතිකවාදීහු එය පිළිගත්හ.
(4) එම දෘෂ්ටිය ආත්ම වාදයට ප්‍රතිපක්ෂ වේ.
(5) ජෛන දහම එය ප්‍රතික්ෂේප කරයි.

34. බුද්ධ දේශිත පටිච්චසමුප්පාදයෙහි සුවිශේෂත්වය ප්‍රකටවන ප්‍රකාශය නම්,

(1) "එය මධ්‍යම ප්‍රතිපදාව වේ" යන්නයි.
(2) "එහි එක ම අරමුණ නිවන් මග හෙළිකිරීමය" යන්නයි.
(3) "එහි ඇත්තේ අංග දොළහක් පමණි" යන්නයි.
(4) "එමගින් සමාජ ගැටලු විවරණය නොවේ" යන්නයි.
(5) "එය මධ්‍යම දේශනාවකි" යන්නයි.

[පස්වැනි පිටුව බලන්න

35. ආර්ථික හා දේශපාලන කරුණු මුල්කොටගෙන සමාජයේ උපදනා දුක් දොම්නස් පෙන්වා දෙන ප්‍රකට සූත්‍ර දේශනාවක් වන්නේ,
(1) අරියපරියේසන සූත්‍රයයි. (2) චක්කවත්තිසීහනාද සූත්‍රයයි. (3) පරාභව සූත්‍රයයි.
(4) වණිජ්ජා සූත්‍රයයි. (5) වාසෙට්ඨ සූත්‍රයයි.

36. පහත දැක්වෙන ධර්ම පාඨ අතුරෙන් මානව ශක්‍යතාව ප්‍රකට වන්නේ,
(1) "ධම්මො හවෙ රක්ඛති ධම්මචාරි" යන්නෙනි.
(2) "කම්මස්සකා මානව සත්තා" යන්නෙනි.
(3) "ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධ සාසනෙ" යන්නෙනි.
(4) "සබ්බෙ සත්තා මරිස්සන්ති" යන්නෙනි.
(5) "නිබ්බාණං පරමං සුඛං" යන්නෙනි.

37. "තමා ද අනුන් ද යන දෙපක්ෂයේ ම අහිත පිණිස වන ක්‍රියා අකුසල් ය. හිත පිණිස වන ක්‍රියා කුසල් ය." මෙම නිර්ණායකය දැක්වෙන්නේ,
(1) අභිධර්මයේ ය. (2) අම්බලට්ඨිකරාහුලෝවාද සූත්‍රයේ ය.
(3) අත්තහිත සූත්‍රයේ ය. (4) විශුද්ධි මාර්ගයේ ය.
(5) කාලාම සූත්‍රයේ ය.

38. දස පින්කිරියවත්වලට ඇතුළත් වෙය්‍යාවච්ච, අපචායන යන පුණ්‍ය ක්‍රියා වස්තූන් දෙකින් ප්‍රකාශ වන්නේ,
(1) පින්දීම හා පින් අනුමෝදන් වීමයි.
(2) අනුන්ට අවමන් නොකිරීම හා උපකාර කිරීමයි.
(3) උපස්ථාන කිරීම හා ගෞරව කිරීමයි.
(4) උතුමන්ට පෙර ගමන් කිරීම හා පසු ගමන් කිරීමයි.
(5) අනුන් පීඩාවට පත් නොකිරීම හා සුවපත් කිරීමයි.

39. සතර බ්‍රහ්මවිහරණවල එන මුදිතා ගුණයෙන් ප්‍රකාශ වන්නේ,
(1) මුදු මොලොක් බවයි. (2) පිනෙන් සිත පිනා යාමයි.
(3) මෛත්‍රී සහගත බවයි. (4) අනුන්ගේ සැපත දැක සතුටු වීමයි.
(5) මුදුනත් තබා වැදීමයි.

40. කර්මයේ ප්‍රභේද දැක්වෙන බෞද්ධ ඉගැන්වීම්වල ආචිණ්ණ කම්ම යන්නෙන් දැක්වෙන්නේ,
(1) බලවත් වූ දුර්විපාක හෝ සැප විපාක දෙන කර්මයි.
(2) කලක් පුරුදු පුහුණු කළ අකුසල හෝ කුසල කර්මයි.
(3) මරණාසන්න අවස්ථාවේ සිහිපත් වන කුසලාකුසල කර්මයි.
(4) මීළඟ ආත්ම භාවයේදී ම විපාක දෙන කර්මයි.
(5) පූර්ව භවයේදී කළ කුසලාකුසල කර්මයි.

41. කූටදන්ත සූත්‍රයට අනුව අවිධිමත් රාජ්‍ය පාලනයෙන් පීඩාවට පත් නිර්ධනයන් මං පැහැරීමාදී අනිසි ක්‍රියාවල යෙදෙන විට රජු විසින් කළ යුත්තේ,
(1) ඔවුන්ට අවශ්‍ය ධනය බෙදා දීමයි.
(2) සොරුන් අල්ලා දරුණු දඬුවම් දීමයි.
(3) ගොවිතැන් සහ වෙළඳාම් ආදී රැකී රක්ෂා සඳහා අනුග්‍රහ දැක්වීමයි.
(4) ප්‍රජාවට බදු සහන ලබාදීමයි.
(5) ආහාරපානාදී අවශ්‍යතා සැපයීමයි.

42. සිගාලෝවාද සූත්‍රය අනුව ආර්ථික සුරක්ෂිතතාව ඇති කරගැනීමට අප විසින් කළ යුතු එක් කාර්යයක් නම්,
(1) වැඩි වැඩියෙන් භාණ්ඩ නිපදවීමයි. (2) ඉපැයීම්වලින් දෙකොටසක් ආයෝජනය කිරීමයි.
(3) අනවශ්‍ය වියදම් කපා හැරීමයි. (4) උත්සාහයෙන් කටයුතු කිරීමයි.
(5) උපයාගත් සම්පත් ආරක්ෂා කරගැනීමයි.

43. උපයාගත් ධනය පරිභෝග කිරීමේදී ඉටු කළ යුතු යුතුකම් පහක් පඤ්චබලි නමින් පෙළදහමේ දැක්වේ. ඉන් එකක් නම්,
(1) රජුන්ට අදාළ යුතුකම් ඉටුකිරීමයි.
(2) හිතමිතුරන්ට සංග්‍රහ කිරීමයි.
(3) අනාගත පරපුර සඳහා ඉතිරි කර තැබීමයි.
(4) ගුරුඋතුමන්ට කළගුණ සැලකීමයි.
(5) ආබාධිත ජනයාට සත්කාර කිරීමයි.

44. දස රාජධර්මයන්ට ඇතුළත් 'අජ්ජවං' යන්නෙන් අදහස් වන්නේ පාලකයා,

(1) මධ්‍යස්ථව ක්‍රියා කිරීමයි.
(2) බලයෙන් මත් නොවීමයි.
(3) සීමාව දැන වැඩ කිරීමයි.
(4) ඍජුව ක්‍රියා කිරීමයි.
(5) අපරාධ මර්දනය කිරීමයි.

45. සිය රාජ්‍යයේ පිරිහීම වළක්වා අභිවෘද්ධිය ඇති කර ගැනීම සඳහා ලිච්ඡවී රජ දරුවන් විසින් ක්‍රියාවට නැගූ පිළිවෙත් අතුරින් එකක් වන්නේ,

(1) ඉන්ද්‍රිය සංවරයෙන් කටයුතු කිරීමයි.
(2) ධනෝපායනය වැඩිදියුණු කිරීමයි.
(3) අධාර්මික ක්‍රියා වැළැක්වීමයි.
(4) ජනතාවට ආරක්ෂාව සැලසීමයි.
(5) පූජ්‍යයන්ට අවශ්‍ය පහසුකම් සලසා දීමයි.

46. සමථ භාවනාව පිළිබඳව එක් ශිෂ්‍යයෙකු විසින් ලියන ලද වාක්‍ය රචනාවක ඇතුළත් කරුණු කිහිපයක් පහතින් දැක්වේ. ඒ අතුරෙන් **සාවද්‍ය** කරුණ කුමක් ද?

(1) සමථ භාවනාව යනු තිලකුණු මෙනෙහි කිරීමයි.
(2) සමථ භාවනාවෙන් නීවරණ යටපත් වෙයි.
(3) ධ්‍යාන ලැබිය හැක්කේ සමථ භාවනාවෙනි.
(4) සමථය වැඩූ ශ්‍රමණයෝ බුදුරදුන් දවස ද වූහ.
(5) සමථයෙන් යටපත් වූ කෙලෙස් නැවත මතුවිය හැකි ය.

47. විදර්ශනා භාවනාවේ ආනිශංසයක් වශයෙන් ඉගැන්වෙන සමුච්ඡේද ප්‍රහාණය යනු,

(1) තදංග වශයෙන් කෙලෙස් යටපත් කිරීමයි.
(2) සියලු කෙලෙස් සපුරා ප්‍රහීණ කිරීමයි.
(3) රාගාදි කෙලෙස් ඇති සැටියෙන් දැන ගැනීමයි.
(4) කෙලෙස් දහම් ප්‍රහාණය කළ යුතු බව තේරුම් ගැනීමයි.
(5) ධ්‍යාන බලයෙන් කෙලෙස් ඔබා තැබිය හැකිවීමයි.

48. මෛත්‍රී භාවනාව වැඩීමෙන් ලැබෙන ආනිශංස අතුරෙන් එකක් නම්,

(1) මරණින් මතු දෙව්ලොව ඉපදීමයි.
(2) පවිටු සිහින නොදැකීමයි.
(3) ග්‍රහ අපල දුරුවීමයි.
(4) ගමනේදී ආරක්ෂාව ලැබීමයි.
(5) ප්‍රත්‍ය පහසුකම් සුලභ වීමයි.

49. සතර සතිපට්ඨානයෙහි ධම්මානුපස්සනාවට අයත් වන්නේ,

(1) පඤ්චනීවරණ ධර්ම තමා තුළ ඇති නැති බව මෙනෙහි කිරීම ය.
(2) දහම් ගුණ මෙනෙහි කිරීම ය.
(3) ආශ්වාසය හා ප්‍රශ්වාසය මෙනෙහි කිරීම ය.
(4) තමා තුළ ඇති උසස් ගුණධර්ම මෙනෙහි කිරීම ය.
(5) සතර ඉරියව්වෙහි ම මනා සිහිය පිහිටුවා ගැනීම ය.

50. භාවනාවට එළඹිය යුත්තේ තම චරිතයට ගැළපෙන කර්මස්ථානය තේරුම් ගෙන යැයි ධර්ම ග්‍රන්ථවල දක්වා ඇත. එම චරිත අතුරෙන් එකක් වන්නේ,

(1) ඥාණ චරිතයයි.
(2) කාම චරිතයයි.
(3) ව්‍යාපාද චරිතයයි.
(4) තර්ක චරිතයයි.
(5) සද්ධා චරිතයයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

බුද්ධ ධර්මය II
பௌத்தம் II
Buddhism II

**41 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:
* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) 'අනුත්තර පුරිසදම්මසාරථි' බුදුගුණය හඳුන්වන්න. (ලකුණු 02යි.)
   (ii) 'මහාප්‍රඥාව' නිර්වචනය කරන්න. (ලකුණු 04යි.)
   (iii) බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට ශාස්තෘත්වය ප්‍රකට වන අවස්ථා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)
   (iv) බුදුරදුන්ගේ පද්මාකාර ජීවිතය විමසුමට ලක් කරන්න. (ලකුණු 08යි.)

2. (i) 'උපසම්පදාව' යනු කුමක්දැයි හඳුන්වා දෙන්න. (ලකුණු 02යි.)
   (ii) සතර පාරාජිකා අතුරෙන් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)
   (iii) ඤත්තිචතුත්ථකම්ම උපසම්පදාව විස්තර කරන්න. (ලකුණු 06යි.)
   (iv) විනය නීති පැනවීමට බුදුන් හේතු පිළිබඳ විමසුමක් කරන්න. (ලකුණු 08යි.)

3. (i) බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ක්ෂත්‍රියයන්ට අයත් කාර්ය **සතරක්** නම් කරන්න. (ලකුණු 02යි.)
   (ii) ඊශ්වර නිර්මාණ වාදය පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)
   (iii) අමරාවික්ෂේප වාදය විස්තර කරන්න. (ලකුණු 06යි.)
   (iv) පුබ්බෙකතහේතු වාදය පිළිබඳ බෞද්ධ විචාරය ගෙනහැර දක්වන්න. (ලකුණු 08යි.)

## II කොටස

4. (i) තෙවන ධර්ම සංගායනාවට තුඩුදුන් ශාසනික පසුබිම විස්තර කරන්න. (ලකුණු 08යි.)
   (ii) එම සංගායනාවෙන් සසුනෙහි චිර පැවැත්මට සිදු වූ මෙහෙවර ඇගයුමට ලක් කරන්න. (ලකුණු 12යි.)

5. (i) (කරණීය) මෙත්ත සූත්‍රය අනුව ජීව පරිසරය විග්‍රහ කරන්න. (ලකුණු 08යි.)
   (ii) අජීව පරිසරය ආරක්ෂා කරගැනීමට අදාළ බෞද්ධ සදුපදේශ කවරේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 12යි.)

6. (i) අත්තකිලමථානුයෝගය පිළිබඳ විවරණයක් කරන්න. (ලකුණු 08යි.)
   (ii) දුක්ඛ සමුදයාර්ය සත්‍යය ධර්මානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 12යි.)

7. (i) පන්සිල් රැකීමෙන් සිදුවන සමාජ යහපත පෙන්වා දෙන්න. (ලකුණු 08යි.)
   (ii) උපෝසථ අෂ්ටාංග ශීලය පඤ්චශීලයට වඩා උසස් වන්නේ කවර කරුණු නිසාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 12යි.)

8. (i) සාමකාමී රාජ්‍ය පාලනයකට දස රාජ ධර්මවලින් ලැබෙන අනුබලය විස්තර කරන්න. (ලකුණු 08යි.)
   (ii) 'ප්‍රජා නායකයා සමාජ සුඛසාධකයෙකි.' බෞද්ධ ඉගැන්වීම් අනුව පැහැදිලි කරන්න. (ලකුණු 12යි.)

* * *